# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල. ☎ 011 279 740

"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல. 📠 011 286 405

"Mihikatha Medura", Land Secretrial, 1200/6, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல / My No. } චක්‍රලේඛ අංක - 2015/09(I)

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2018. 12.26

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

ඉඩම් කොමසාරිස්වරු/ නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්) වෙත,

<u>රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබාදෙමේදී එකවර දීමනාපත්‍ර ලබා දීම</u>

නේවාසික කටයුත්තක් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් දීමනාපත්‍රයක් ලබාදීමේදී අනුගමනය කරන පවතින ක්‍රමවේදයන්ගේ සංකීර්ණතා නිසා සේවාලාභීන්ට පවතින දුෂ්කරතාවයන් මග හරවා ගැනීමට හා පරිපාලන ක්‍රියාවලිය සරල කර වැඩ පියවරයන් කඩිනම් කර ගැනීමට නිකුත් කර ඇති මාගේ 2015.12.30 දිනැති හා 2015/09 චක්‍රලේඛයේ II හා III කාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාකිරීමේදී පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

එකී II හා III කාණ්ඩයන්ට අදාලව මේ වන විට බදු අනුමැතිය ලබා ඇති හා දීර්ඝකාලීන බදුකර නිකුත් කර ඇති රජයේ ඉඩම් බදු ගැනුම්කරුවන් විසින් නිසි පරිදි සංවර්ධනය කර භුක්ති විඳින්නේ නම්, බදු පදනම් වර්ෂයේ නොදියුණු තක්සේරුව සම්පූර්ණයෙන් හා වාර මුදල/ දඩ මුදල අයකර ගැනීමට කටයුතු කරන්න. දෙවන බදු කාලයක් අනුමත කර තිබේනම්, දෙවන බදු කාලයට අදාළව දීමනාපත්‍රය ඉල්ලුම් කළ දින දක්වා බදු මුදල් අයවිය යුතුවේ.

මෙම අවස්ථාවන් දෙකට අදාලව පළමුව O රේඛා චිත්‍ර ඉල්ලුම් කිරීමට පෙර දීමනාපත්‍ර අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර නිසි පරිදි සංවර්ධනය කර තිබේනම් දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී වෙත O රේඛා චිත්‍ර මැනුම් ඉල්ලීමක් යොමු කරන්න. එකී පූර්ව අවශ්‍යතාවයන් සම්පූර්ණ වීමෙන් පසු එකවර දීමනාපත්‍ර ලබාදීම සඳහා පහත ලියවිලි ද සහිතව ඔබගේ නිර්දේශ පළාත් ඉඩම් කොමසාරිස්/ ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (අන්තර් පළාත්) හරහා මා වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

1. නිදහස් දීමනාපත්‍ර සඳහා සලකා බැලීමේ වාර්තාව
2. නොදියුණු වටිනාකම හා වාර මුදල/ දඩ මුදල සම්පූර්ණයෙන්ම අයකරන ලද බවට සනාථ කරන රිසිට්පත්වල/ බදු අයකළ බදු ලෙජරයේ සහතික කරන ලද පිටපත්, දෙවන බදු කාලයක් තිබේනම් ඊට දක්වා බදු මුදල් අයකළ බවට සනාථ කරන රිසිට්පත්වල/ බදු ලෙජරයේ සහතික කරන ලද පිටපත්
3. තක්සේරු වාර්තාවේ සහතික කරන ලද පිටපත
4. දීර්ඝකාලීන බදුකරයක් නිකුත් කර ඇත්නම් දීර්ඝකාලීන බදුකරය අවලංගු කිරීමේ එකඟතා ගිවිසුම හා බදුකරයේ මුල් පිටපත
5. බදුකරයක් නිකුත් කර ඇත්නම් පත්ඉරු වාර්තා
6. O රේඛා චිත්‍ර මැනුම් ඉල්ලීමේ පිටපත්

දැනටමත් බදු අනුමැතීන්ට අදාළව දීර්ඝකාලීන බදුකර පිළියෙල කිරීම සඳහා මා වෙත L රේඛා චිත්‍ර යොමුකර ඇත්නම්, මාගේ 2017/03 චක්‍රලේඛ ප්‍රකාරව මවිසින් එම L රේඛා චිත්‍ර, O රේඛා චිත්‍ර බවට දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී මඟින් පරිවර්තනය කර ගැනීමට කටයුතු කරනු ඇත.

මේ අනුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබාදීමේදී ඉහත සඳහන් කරුණු වලට අදාල වන පුද්ගලයින් වෙත පළමුව දීමනාපත්‍ර අනුමැතිය ලබා ගැනීමේ වැඩ පියවර මෙම සංශෝධිත කරුණු මඟින් ඉවත් කරන අතර එකවර දීමනාපත්‍ර ලබාදීම සඳහා මේ පිළිබඳ දැනුවත්කර සුදුසුකම් ලබන පුද්ගලයින්ගේ ඉල්ලීම් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ඔබ විසින් පියවර ගත යුතුයි.

මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් මා විමසන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:-

1. ලේකම්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
3. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - කා.දැ.ගැ.ස.